# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயற்றிறன் அறிக்கை

# Annual Performance Report

# 2025

**ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

**கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக்களம்**

**Department of Project Management and Monitoring**

**වැය ශීර්ෂ අංක : 280**

**செலவினத் தலைப்பு இலக்கம் : 280**

**Expenditure Head No: 280**

**මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு**

**Ministry of Finance, Planning and Economic Development**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව – 2025

## ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
## වැය ශීර්ෂ අංකය: 280


**පරිච්ඡේද 01 – ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

**පරිච්ඡේද 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

**පරිච්ඡේද 03 – වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය**

**පරිච්ඡේද 04 – කාර්යසාධන දර්ශක**

**පරිච්ඡේද 05 – තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සපුරාගැනීමේ කාර්යසාධනය**

**පරිච්ඡේද 06 – මානව සම්පත් පැතිකඩ**

**පරිච්ඡේද 07 – අනුකූලතා වාර්තාව**

# පරිච්ඡේද 01 – ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

රාජ්‍යය ආයෝජන කාර්යක්ෂමව හා උපරිම ප්‍රයෝජනවත් ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා, රේඛීය අමාත්‍යාංශ සහ ආයතන විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්, එකඟ වූ වියදම් හා කාල සීමාවන් තුළ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, දැඩි අධීක්ෂණ ක්‍රියාවලියක් මඟින් ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය අදාළ පාර්ශ්වයන්ට වාර්තා කිරීමටත්, ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධා හා ගැටලු පිළිබඳ සාධාරණ හා දැනුවත් තීරණ ගැනීමටත් හැකියාව ලැබේ.

මෙම අරමුණු ඉටු කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (DPMM) ව්‍යාපෘති හා වැඩසටහන් සුමට ක්‍රියාත්මක කිරීම සඳහා අධීක්ෂණය, උපදේශනය හා පහසුකම් සපයමින් වැදගත් භූමිකාවක් ඉටු කරයි.

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘති ඇගයීම සඳහා ප්‍රධාන සම්බන්ධීකරණ ආයතනය ලෙස කටයුතු කරමින්, රාජ්‍ය අංශය තුළ ඇගයීම් සංස්කෘතිය වර්ධනය කිරීම සහ ජාතික ඇගයීම් ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙයි. තවද, රාජ්‍ය ආයෝජනවල ප්‍රශස්ත භාවිතය සහතික කිරීම සඳහා නිසි සැලසුම්කරණය, තීරණ ගැනීම සහ සම්පත් වෙන්කිරීම සඳහා උපකාරී වන පරිදි, ඇගයීම් ප්‍රතිඵල සහ නිර්දේශ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අදාළ පාර්ශ්වයන් වෙත සන්නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂයේදී, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට (PFM Act) අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පිහිටුවන ලද රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව (PIMEC) මඟින් අධීක්ෂණය හා ඇගයීම සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව පහසුකම් සපයන ලදී. සියලු සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතිවල කාර්ය සාධනය සමාලෝචනය කර ක්‍රියාත්මක කිරීමේදී පැනනගින බාධක නිරාකරණය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ක්‍රමානුකූලව ඇගයීමට ලක්කර, නියමිත කාලරාමුවක් තුළ ක්‍රියාත්මක කිරීමේ පියවර සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණීම අරමුණු කරගනිමින් , ඒකාබද්ධ කාර්තු පාදක ප්‍රගති සමාලෝචන රැස්වීම් (IQPRMs) යන නව යාන්ත්‍රණය අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් හඳුන්වා දෙන ලදී.

තවද, රේඛීය අමාත්‍යාංශ තුළ ප්‍රතිඵල මූලික කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා අමාත්‍යාංශ ප්‍රතිඵල රාමු (MRFs) හඳුන්වා දී ඇති අතර, අයවැය යෝජනා ක්‍රියාත්මක වීම අධීක්ෂණය සඳහා මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් මඟින් සමස්ත අධීක්ෂණ රාමුව තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය.

එක් එක් අමාත්‍යාංශ අධීක්ෂණ හා කළමනාකරණ (M&E ) කටයුතු සඳහා වගකිව යුතු නිලධාරීන් අතර සම්බන්ධීකරණය, දැනුම හුවමාරුව සහ සහයෝගීතාව වැඩිදියුණු කිරීම සඳහා ජාතික අධීක්ෂණ හා ඇගයීම් ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කරන ලදී. 2025 වසරේදී මෙම උත්සාහයන් රාජ්‍යය ආයෝජන කළමනාකරණයේ කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීමට දායක වූ අතර, ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා තීරණ ගැනිම සඳහා කාලෝචිත සහ විශ්වාසනීය තොරතුරු ලබා දීම මඟින් නිවැරදි තීරණ ගැනීම, සම්පත් ප්‍රශස්තව භාවිත කිරීම සහ සංවර්ධන ප්‍රතිඵල ඉහළ නැංවිම සඳහා සහාය විය.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම:**
සංවර්ධනයේ සඵලදායීතාව කරා

**මෙහෙවර:**
අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය සහතික කරනු වස් සියලුම සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය, ඇගයීම සහ පහසුකම් සැපයීම මෙන්ම ක්‍රියාත්මක කරනු ලබන ආයතන වෙත උපදේශන සේවා සැපයීම.

**අරමුණ:**
සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම තුළින් එකඟ වූ කාල රාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම.

දේශීය හා විදේශීය මූල්‍ය ප්‍රභවයන් මගින් අරමුදල් සපයන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති හා වැඩසටහන් කාර්යක්ෂමව සහ නියමිත කාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උපායමාර්ගික අධීක්ෂණය, තාක්ෂණික මාර්ගෝපදේශනය, සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම සිදු කරයි. ව්‍යුහගත අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේද, ප්‍රගති සමාලෝචන සහ ආයතන අතර සම්බන්ධීකරණය මගින් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, වගවීම ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ආයෝජනවල මුදලට උපරිම වටිනාකම ලබාදීම සඳහා මෙම දෙපාර්තමේන්තුව දායක වේ.

## 1.3 ප්‍රධාන කාර්යයන්

1. දේශීය සහ විදේශීය මූල්‍යායනය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්හි තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය හා අධීක්ෂණය.
2. විශාල සහ මහා පරිමාණයේ ව්‍යාපෘති හා වැඩසටහන්හි කාර්යසාධනය කාර්තුමය වශයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම.
3. මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල ගැටළු නිරාකරණය
4. විදේශ මූල්‍යායනය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ වැඩසටහන්හි ප්‍රගතිය සමාලෝචනය සඳහා සංවර්ධන පාර්ශවකරුවන් වෙත පහසුකම් සැලසීම.
5. තෝරාගත් විදේශ මූල්‍යායනය සහිත ව්‍යාපෘතින්හි ප්‍රතිඵල අත්පත් කරගැනීමේ ප්‍රගතිය සත්‍යාපනය කිරීම හා මූල්‍ය ආධාර සපයනු ලබන ආයතනවලට එම ණය වාරික නිදහස්කල හැකිවන පරිදි ව්‍යාපෘතිවල ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තා කිරීම.
6. ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම.
7. විවිධ පාර්ශවයන් විසින් කරනු ලබන ඉල්ලීම් මත පදනම්ව ව්‍යාපෘති ඇගයීම් සිදුකිරීම හා ඒ තුළින් සැලසුම් ක්‍රියාවලිය සඳහා නිර්දේශ ලබාදීම.
8. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වල කාර්ය සාධන වාර්තා ප්‍රකාශයට පත්කිරීම තුළින් සංවර්ධන තොරතුරු බෙදා හැරීම

## 1.4 සංවිධාන සටහන: (ඇමුණුම 1)

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් පස්දෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ තාක්ෂණික ඒකක 12කින් සහ ආයතනික ඒකක 2කින් සමන්විත ලෙස පහත පරිදි ව්‍යුහගත වී ඇත.

**තාක්ෂණික ඒකක:**

1. සමාජ ආරක්ෂණ, සෞඛ්‍ය, තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ
2. අධ්‍යාපන, උසස් අධ්‍යාපන, නිපුණතා සංවර්ධන
3. කෘෂිකර්ම හා පශු සම්පත්
4. වැවිලි සහ ධීවර කර්මාන්තය
5. වාරිමාර්ග හා ඉඩම්
6. කම්කරු, තරුණ හා ක්‍රීඩා, වෙළෙඳ, සංචාරක
7. පරිසර හා වනජීවී, ආපදා කළමනාකරණ, වෙරළ සංරක්ෂණ
8. නාගරික හා පහත් බිම් සංවර්ධන, නිවාස
9. ජල හා සනීපාරක්ෂාව
10. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා, වරාය හා මාර්ග
11. විදුලිබල හා බලශක්ති
12. රාජ්‍ය පරිපාලන, අභ්‍යන්තර කටයුතු, මාධ්‍ය, ආගමික, සංස්කෘතික, පළාත් පාලන, ආරක්ෂක, නීති හා කලාපීය සංවර්ධන

**පරිපාලන ඒකක:**

1. පාලන
2. මූල්‍ය

# පරිච්ඡේද 02 – ප්‍රගතිය හා අනාගත දැක්ම

## 2.1 සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය හා වාර්තා කිරීම

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (PFMA) අනුව, සියලු රාජ්‍ය ආයෝජන අධීක්ෂණය කිරීම සහ විශාල හා මහා පරිමාණ ව්‍යාපෘති සඳහා කාර්තුමය ප්‍රගති වාර්තා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බලය පවරා ඇත. අධීක්ෂණ ක්‍රියාවලිය තුළ අනුමත සැලසුම් හා ව්‍යාපෘති අරමුණු වලට අනුකූලවූ භෞතික හා මූල්‍ය ප්‍රගතිය, අවදානම් තක්සේරුව හා ගැටලු කළමනාකරණය, යනාදිය ඇතුළත් වේ. ව්‍යාපෘති කාර්ය සාධන තත්ත්වය ප්‍රගතිය, කාල රාමු, වියදම් කළමනාකරණය සහ අවදානම් අවම කිරීම පිළිබිඹු කරන වර්ණ-කේත පද්ධතියක් භාවිතයෙන් වර්ගීකරණය කරනු ලැබේ. මෙය සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීම සහ කාලෝචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව සලසයි.

2025 වසරේදී, සියලු රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ සියලු ක්ෂේත්‍ර ආවරණය කරමින් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විශාල හා මහා පරිමාණ ව්‍යාපෘති 200කට වැඩි සංඛ්‍යාවක් අධීක්ෂණය කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් 2024 වසරේ සිව්වන කාර්තුවේ ප්‍රගති වාර්තාව සහ 2025 වසරේ පළමු, දෙවන සහ තෙවන කාර්තු ප්‍රගති වාර්තා නිර්දේශ සමඟ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට හැකි විය.

2025 වසර තුළ විදේශීය සහ දේශීය මූල්‍ය සම්පත් භාවිතා කරමින් විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ විශාල හා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 216ක් ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යාපෘතිවල ප්‍රගතිය අදාළ අමාත්‍යාංශවලින් මාසිකව එකතු කරන ලදී. මෙම ව්‍යාපෘති අතරින් 114ක් දේශීය අරමුදල් මඟින් මූල්‍යනය කර තිබූ අතර ව්‍යාපෘති 102ක් විදේශ අරමුදල් මඟින් මූල්‍යනය කර තිබුණි.

**වගු අංක 2.1 : සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය හා වාර්තා කිරීම**

| අරමුදල් මූලාශ්‍රය | ව්‍යාපෘති ගණන |
|---|---|
| දේශීය අරමුදල් (GoSL) | 111 |
| දේශීය ණය (දේශීය බැංකු ණය) | 03 |
| දේශීය මූල්‍යකරණය යටතේ මුළු ව්‍යාපෘති | **114** |
| විදේශ ණය | 73 |
| විදේශ ප්‍රදාන | 29 |
| විදේශ මූල්‍යකරණය යටතේ මුළු ව්‍යාපෘති | **102** |
| මුළු ව්‍යාපෘති (දේශීය හා විදේශ මූල්‍යකරණය) | **216** |

ඊට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් ලබා දෙන තාක්ෂණික සහාය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව, රාජ්‍ය ආයෝජන කළමනාකරණයේ අධීක්ෂණ හා ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ රෙගුලාසි සහ මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලදී.

මෙම නියාමන මෙවලම් රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීමේ ක්‍රියාවලීන් සම්මත කිරීම හා වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන සැලසුම් කරන ලදී. රාජ්‍ය ආයෝජන භාවිතයේදී මූල්‍ය විනය, මුදලට වටිනාකම (Value for Money), විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා විශේෂ අවධානය යොමු කරන ලදී.

## 2.2 ක්ෂේත්‍ර අධීක්ෂණය

ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය තුළ හඳුනාගත් සමහර ව්‍යාපෘතිවල පවතින ගැටලු විසඳීම පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය. එබැවින්, රේඛීය අමාත්‍යාංශ විසින් ලබාදෙන මාසික හා කාර්තු වාර්තා සහ පාර්ශවකරුවන් සමඟ පැවැත්වෙන ව්‍යාපෘති කාර්ය සාධන රැස්වීම් පමණක් ව්‍යාපෘතිවල සැබෑ තත්ත්වය තහවුරු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින්, ක්ෂේත්‍ර අධීක්ෂණ මඟින් සිදු කරන නිරීක්ෂණ ඉතා වැදගත් වේ.

ක්ෂේත්‍ර අධීක්ෂණ යනු ව්‍යාපෘති ක්‍රියාත්මක වීම භූමිය මට්ටමින් සත්‍යාපනය කිරීම සහ වාර්තාගත ප්‍රගතිය තහවුරු කිරීම සඳහා භාවිත වන ප්‍රධාන යාන්ත්‍රණයකි. එබැවින්, ව්‍යාපෘති වාර්තාකරණයේ නිරවද්‍යතාව, විශ්වසනීයත්වය සහ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍ර අධීක්ෂණ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එමඟින් කාර්යාලීය වාර්තාකරණය මඟින් සම්පූර්ණයෙන් අනාවරණය නොවන ක්‍රියාත්මක කිරීමේ අභියෝග, මෙහෙයුම්මය සීමාවන් සහ ක්ෂේත්‍රයේ සැබෑ තත්ත්වයන් සෘජුව නිරීක්ෂණය කිරීමට අවස්ථාව සැලසේ.

ක්‍රමවත් නිරීක්ෂණය හා අධීක්ෂණය සහතික කිරීමේ අරමුණින්, මෙම දෙපාර්තමේන්තුව විසින් සෑම වසරකම ආරම්භයේදී එක් එක් ක්ෂේත්‍රය සඳහා වාර්ෂික ක්ෂේත්‍ර අධීක්ෂණ සැලැස්මක් සකස් කරනු ලබයි. ඒ අනුව, ඉහළ බලපෑමක් ඇති සහ ඉහළ අවදානම් සහිත ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් 2025 වර්ෂයට අදාළ විශේෂිත ක්ෂේත්‍ර අධීක්ෂණ සැලසුම් සකස් කරන ලදී. මෙහි අරමුණ වූයේ ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්යක්ෂම ලෙස නිරීක්ෂණය කිරීම, ගැටලු කාලෝචිතව හඳුනා ගැනීම සහ ව්‍යාපෘති කාර්ය සාධනය තවදුරටත් වැඩිදියුණු කිරීමයි.

2025 වසර තුළ ප්‍රමුඛ ව්‍යාපෘති ආවරණය කරමින් ක්ෂේත්‍ර අධීක්ෂණ 37ක් සිදු කරන ලදී. මෙම අධීක්ෂණ මඟින් අනුමත කාල රාමු, අයවැය සහ ගුණාත්මක ප්‍රමිතීන්ට අනුකූලතාව ඇගයීම, සම්පත් භාවිතය සහ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව සනාථ කිරීම, ප්‍රතිලාභීන් හා ප්‍රාදේශීය පාර්ශවකරුවන් සමඟ සෘජුව සම්බන්ධ වීම යනාදිය සිදු කරන ලදී.

ක්ෂේත්‍ර අධීක්ෂණ මඟින් ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත අවදානම් ඉක්මනින් හඳුනාගැනීමට, ප්‍රතිඵල සනාථ කිරීමට සහ කාලෝචිත මැදිහත්වීම් සඳහා සහාය දීමට ඇති හැකියාව ශක්තිමත් කරමින්, පුරවැසි-කේන්ද්‍රීත ප්‍රතිඵල ලබා ගැනීමට සෘජුව දායක වී ඇත.

වසර තුළ සිදු කළ ක්ෂේත්‍ර අධීක්ෂණ 37 තුළ ව්‍යාපෘති 60ක් නිරීක්ෂණය කරන ලද අතර, ක්ෂේත්‍ර නිරීක්ෂණ, වාර්තා සහ දත්ත මත පදනම්ව සංවර්ධන ව්‍යාපෘතිවල ගැටලු විසඳීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විශේෂ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ක්ෂේත්‍ර පරීක්ෂණවලදී ගත් ඡායාරූප කිහිපයක් මෙම වාර්තාවේ 06 සිට 10 දක්වා පිටුවල ඉදිරිපත් කර ඇත.

| වගු අංක 2.2 : ක්ෂේත්‍ර අධීක්ෂණ ප්‍රගතිය<br>*(01.01.2025 – 31.12.2025 දක්වා)* | | | |
|---|---|---|---|
| ක්ෂේත්‍රය | ක්ෂේත්‍ර අධීක්ෂණ ගණන | ක්ෂේත්‍ර අධීක්ෂණයෙන් ආවරණය කළ ව්‍යාපෘති ගණන | පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කළ වාර්තා ගණන |
| අධ්‍යාපන, උසස් අධ්‍යාපන, නිපුණතා සංවර්ධන / ආරක්ෂක හා ආපදා කළමනාකරණ / මහජන ආරක්ෂාව හා පාර්ලිමේන්තු කටයුතු | 04 | 08 | 08 |
| කෘෂිකර්ම හා වාරිමාර්ග | 05 | 05 | 05 |
| සෞඛ්‍ය හා තරුණකටයුතු හා ක්‍රීඩා | 04 | 12 | 12 |
| විදේශ කටයුතු හා නීතිය | 02 | 04 | 04 |
| නාගරික හා ප්‍රවාහන | 05 | 05 | 05 |
| ජල ක්ෂේත්‍රය | 01 | 01 | 01 |
| මහාමාර්ග ක්ෂේත්‍රය | 09 | 18 | 18 |
| විදුලිබල හා බලශක්ති | 01 | 01 | 01 |
| රාජ්‍ය පරිපාලන, අභ්‍යන්තර කටයුතු, ආගමික, සංස්කෘතික, පළාත් පාලන / කාන්තා කටයුතු | 05 | 06 | 06 |
| මුළු එකතුව | 36 | 60 | 60 |

කෘෂිකර්ම හා වාරිමාර්ග

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන
වැමැඩිල්ල වම් ඉවුර ප්‍රධාන ඇළ





**කළු ගඟ - මොරගහකන්ද හුවමාරු ඇළ (විවෘත ඇළ)**





**පළුගස්වැව, ප්‍රධාන පිටවාන පිවිසුම**





**මිණිපේ වම් ඇළ ඉවුර ප්‍රතිසංස්කරණය**





**කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය ඉදිකිරීම.**





රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම.





කුලියාපිටිය නාරංගල්ලේ තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක් ඉදිකිරීම (GOSL/KOICA)





විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD)





**ප්‍රාදේශීය හා පළාත් සංවර්ධන සහ රාජ්‍ය පරිපාලනය**

ජංගම රාක්ක පද්ධතියක් ස්ථාපනය කිරීම





මහා කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන- 3 වන අදියර (යුරෝපීය ආයෝජන බැංකුව- නාරාහේන්පිට





මහා කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන- කිරුළපන කොන්ත්‍රාත්තුව





මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය- පොම්පාගාර





විදුලි බල හා බලශක්ති

හම්බන්තොට විදුලිබල ජාල උපපොළේ බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් ස්ථාපිත කිරීම (BESS)





සෞඛ්‍යය අධ්‍යාපන / තරුණ කටයුතු හා ක්‍රීඩා

තෝරාගත් මූලික රෝහල්හි සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම මීරිගම මූලික රෝහල




ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය - පළාත් හා  දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම, ගම්පහ




**ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා නාවික කටයුතු**

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - (AIUDP)




නැගෙනහිර බහලුම් පර්යන්තය- අදියර 11 (ECT)




## 2.3 විශේෂ රැස්වීම් හා සාකච්ඡා පැවැත්වීම / සංවර්ධන හවුල්කරුවන්ට පහසුකම් සැපයීම

සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමේ මූලික ක්‍රියාකාරකම් විධිමත් කිරීම හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් භූමි අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය වේගවත් කිරීම, අන්තර්-ආයතනික ගැටලු විසඳීම ආදිය සඳහා අදහස් හා යෝජනා ඉදිරිපත් කරමින් අඛණ්ඩ පහසුකම් සැපයීමේ අරමුණින් මෙම දෙපාර්තමේන්තුව විසින් විශේෂ රැස්වීම් පැවැත්විය. මෙම රැස්වීම් සඳහා රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, කොන්ත්‍රාත්කරුවන්, සංවර්ධන පාර්ශවකරුවන් සහ මුදල් අමාත්‍යාංශයේ අනෙකුත් දෙපාර්තමේන්තු නියෝජිතයන් සහභාගී වූහ. එසේම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අනෙකුත් ආයතන විසින් සංවිධානය කරන ලද සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ රැස්වීම් හා සාකච්ඡාවලට ද සහභාගී වූහ.

තවද, ව්‍යාපෘති මඟින් අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල කාලෝචිතව ලබා ගැනීම තහවුරු කිරීම සඳහා සංවර්ධන හවුල්කරුවන් සමඟ වාර්ෂික සමාලෝචන ක්‍රියාවලිය හරහා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික වැඩසටහනේ තවත් ප්‍රධාන අංගයකි.

ඒ අනුව, 2025 වසර තුළ ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලෝක බැංකුව (World Bank) මඟින් සහාය ලබා දෙන ව්‍යාපෘති සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් (Portfolio Review Meetings) පැවැත්වීය. ව්‍යාපෘතිවල අභියෝගාත්මක කරුණු අදාළ බලධාරීන්ගේ අවධානයට යොමු කිරීම මඟින්, ඵලදායී ව්‍යාපෘති කළමනාකරණයක් සඳහා දායකත්වයක් ලබා දී ඇත.

**වගුව 2.3 : සාකච්ඡා සහ විශේෂ රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය (01.01.2025 – 31.12.2025 දින දක්වා)**

| රැස්වීම් / සාකච්ඡා වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| ව්‍යාපෘති ගැටළු පිළිබඳව රේඛීය අමාත්‍යාංශ, ව්‍යාපෘති කළමනාකරණ ඒකක හා මෙම දෙපාර්තමේන්තුව සමඟ පැවති විශේෂ රැස්වීම් | 15 |
| ආධාර සපයන්නන්ගේ සමාලෝචන රැස්වීම් | 23 |
| ප්‍රගති සමාලෝචන රැස්වීම් | 48 |
| ආංශික රැස්වීම් | 06 |
| සංවර්ධන පාර්ශවකරුවන් සමඟ රැස්වීම් | 48 |
| ව්‍යාපෘති මෙහෙයුම් කමිටු / ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම් | 78 |
| වෙනත් විශේෂ රැස්වීම් / සාකච්ඡා | 50 |

## 2.4 රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව

මෙම වසරේ ප්‍රධාන ජයග්‍රහණයක් වූයේ රාජ්‍ය ආයෝජන කළමනාකරණයට සම්බන්ධ ප්‍රධාන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති කාර්ය සාධනය සමාලෝචනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ බාධා විසඳීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ලෙස රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව (PIMEC) ක්‍රියාත්මක කිරීමයි.2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 44(3) වගන්තිය අනුව, රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු පිළිබඳ වේගවත් තීරණ ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින්, සැලසුම්කරණය, සම්පත් වෙන්කිරීම, අයවැයකරණය, මූල්‍යකරණය සහ අධීක්ෂණය සඳහා වගකිවයුතු නිලධාරීන්ගෙන් (උපරිමය 11 දෙනෙකුගෙන්) සමන්විත කමිටුවක් පත් කරන ලදී. මෙහි අරමුණ වන්නේ ප්‍රමාද වැළැක්වීම සහ මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ කාලෝචිතව ලබා දීම සහතික කිරීමයි. රාජ්‍ය ආයෝජන අධීක්ෂණය සඳහා විධිමත්

යාන්ත්‍රණයක් ලෙස රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව (PIMEC) ස්ථාපනය කිරීමත් සමඟ, පෙර ක්‍රියාත්මක වූ ජාතික මෙහෙයුම් කාමරය (NOR) හි කාර්යයන් අවලංගු කරන ලදී. රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව මඟින් වගවීම, පැහැදිලිතාව සහ පුරවැසි-කේන්ද්‍රිත ආයෝජන ප්‍රතිඵල ශක්තිමත් කරමින් ව්‍යාපෘති මඟින් මහජනතාවට උපරිම ප්‍රතිලාභ ලබා දීම සහතික කරයි.

2025 වසර තුළ රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව රැස්වීම් 21ක් පැවැත්වූ අතර, කමිටුව විසින් ලබා දුන් මැදිහත්වීම් හා තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත දක්වා ඇත.

**වගුව අංක 2.4: 2025 වර්ෂයේදී PIMEC විසින් සිදුකළ කටයුතු හා තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය (01.01.2025 – 31.12.2025)**

| ගැටළු වර්ගීකරණය | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| දේශීය සහ විදේශීය අරමුදල් මුදාහැරීම | 18 |
| ණය ගිවිසුම් /ව්‍යාපෘති කාල සීමා දිගු ලබා ගැනීම | 6 |
| පිරිවැය ඇස්තමේන්තු සංශෝධනය | 1 |
| කොන්ත්‍රාත් කළමනාකරණය | 2 |
| ව්‍යාපෘති කාර්ය මණ්ඩල | 6 |
| ඉඩම් හිමිකම් ලබා ගැනීම | 2 |
| පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය | 9 |
| ව්‍යාපෘති කාලසීමාවට අනුව කාර්යයන් ප්‍රමුඛතා දීම | 3 |
| අනෙකුත් කරුණු | 4 |

## 2.5 ව්‍යාපෘති ඇගයීම සහ සාක්ෂ්‍ය-මූලික තීරණ ගැනීම

රාජ්‍ය අංශය තුළ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව (National Evaluation Policy Implementation Framework – NEPIF) ක්‍රියාත්මක කිරීමේදී වැදගත් කාර්යය භාරයක් මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි. අදාල අධිකාරීන්ගෙන් ලැබෙන ඉල්ලීම් අනුව, දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති හා වැඩසටහන් ඇගයීම් සිදු කරමින්, ව්‍යාපෘති සැලැස්ම ශක්තිමත්ව සැලසුම් කිරීම, මූල්‍ය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි ශක්තිමත් කිරීම සඳහා යෝජනා ලබා දෙයි. මෙම ඇගයීම් ප්‍රතිඵල, ප්‍රතිපත්ති සමග සමානුපාතාව, ආයතන කාර්යක්ෂමතාව සහ දිගුකාලීන සංවර්ධන ප්‍රතිඵල වැඩි දියුණු කිරීම මඟින් තිරසාර සංවර්ධනයට සහාය වේ. ව්‍යාපෘති හා වැඩසටහන් ඇගයීම්, සංවර්ධන පියවරවල කාර්යක්ෂමතාව, ක්‍රියාකාරිත්වය සහ තිරසාරභාවය වැඩිදියුණු කිරීමට ක්‍රියාකාරී සහ විශ්වාසදායක සාක්ෂි සපයයි. මෙය පසුගිය අත්දැකීම් හඳුනාගෙන, හොඳ පුරුදු ප්‍රවර්ධනය කරමින්, අනාගත ව්‍යාපෘති සැලැස්මට ඒවා ක්‍රමවත් ලෙස එකතු කිරීමේ හැකියාව සපයයි. එමඟින් නැවත නැවත සිදුවන ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා අවම කරමින්, රාජ්‍ය ආයෝජන කළමනාකරණයේ ගුණාත්මකභාවය ශක්තිමත් කරයි.

ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව (National Evaluation Steering Committee – NESC) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වය යටතේ පවත්වනු ලබයි. NESC සාමාජික සංයුතිය පහත පරිදි වේ:

i. ජාතික ක්‍රමසම්පාදන, විදේශීය සම්පත්, ජාතික අයවැය, රාජ්‍ය ව්‍යාපාර, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තු ප්‍රධානීන් (ස්ථාවර සාමාජිකයන්)
ii. ලේකම්, මුදල් කොමිෂන් සභාව (ස්ථාවර සාමාජික)
iii. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (ස්ථාවර සාමාජික)
iv. ජනාධිපති ලේකම් කාර්යාලය සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයින් (ස්ථාවර සාමාජික)

v. රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් (ආරාධිත)
vi. ජාතික විගණන ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙකු (නිරීක්ෂක)

සාකච්ඡාවලට සහාය වීම සඳහා ඔවුන්ගේ අදාළත්වය සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය අවස්ථාවලදී වෙනත් අදාළ දෙපාර්තමේන්තු, රාජ්‍ය ව්‍යවසායයන්, පළාත් සභා, දිස්ත්‍රික් පරිපාලන ආයතන, පළාත් පාලන ආයතන හෝ වෙනත් ආයතන, වෘත්තීය සංගම් සහ සංවිධාන නියෝජිතයින්ට ආරාධනා මත NESC හි සාමාජිකයින් ලෙස හෝ සහභාගිවන්නන් ලෙස එක්වීමට අවස්ථාව ලබා දී ඇත.

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ රේඛීය අමාත්‍යාංශ 13කින් සහ පළාත් සභා 6කින් ඇගයීම් යෝජනා 23ක් ලැබී තිබුණි. එම යෝජනා තාක්ෂණික ඇගයීම් ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් අනතුරුව, 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතා ඇගයීම් 14ක් තෝරා ගන්නා ලදී.

තෝරාගත් ඇගයීම් අතරින්, ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය යටතේ ක්‍රියාත්මක කරන ලද "මහා කුරුණෑගල ජල සම්පාදන හා අපජල කළමනාකරණ ව්‍යාපෘතිය", "බදුල්ල–චෙන්කලාඩි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය" සහ "වන ආවරණය වැඩි කිරීම සඳහා වූ ප්‍රජා සහභාගීත්ව වැඩසටහන" යන ව්‍යාපෘති තුනට අදාළ අවසන් ඇගයීම් වාර්තා සම්පූර්ණ කරන ලදී.

අනෙකුත් ඇගයීම් වර්ෂය පුරා ක්‍රියාත්මක වෙමින් පැවති අතර, පරිසරය, කාන්තා හා ළමා කටයුතු, කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, ග්‍රාමීය සංවර්ධනය, කර්මාන්ත සංවර්ධනය සහ පළාත් මට්ටමේ ජීවනෝපාය සංවර්ධන මැදිහත්වීම් වැනි ප්‍රමුඛ ක්ෂේත්‍ර ආවරණය කරන ලදී. මීට අමතරව, තෝරාගත් පළාත් මට්ටමේ ව්‍යාපෘති කිහිපයක අවසන් ඇගයීම් වාර්තා ද වාර්තාකරණ කාලසීමාව තුළ සම්පූර්ණ කරන ලදී.

2025 වර්ෂය සඳහා ඇගයීම් කාර්යය සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණි. දෙපාර්තමේන්තුවේ ඇගයීම් ක්‍රියාකාරී සැලැස්ම (Evaluation Action Plan) ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 34.82ක මුළු ප්‍රතිපාදනයක් සුරක්ෂිත කර ගන්නා ලද අතර, එයට අනුමත ඇගයීම් සඳහා දේශීය අයවැය ප්‍රතිපාදන මෙන්ම ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ලද මූල්‍ය සහාය ද ඇතුළත් විය.

2026 වර්ෂයට අදාළ ඇගයීම් වැඩසටහන සම්බන්ධයෙන් ඇගයීම් යෝජනා 15ක් ලැබී තිබූ අතර, ඒවා දෙපාර්තමේන්තු ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. එම කමිටුවේ නිර්දේශ මත පදනම්ව, ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව (National Evaluation Steering Committee - NESC) විසින් 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා ඇගයීම් 9ක් අනුමත කරන ලදී. එම ඇගයීම් අතර රේඛීය අමාත්‍යාංශ මට්ටමේ ඇගයීම් 3ක් සහ පළාත් සභා මට්ටමේ ඇගයීම් 6ක් ඇතුළත් වේ. ඒ අනුව, 2026 වර්ෂයේ එම ඇගයීම් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය අරමුදල්වලින් රුපියල් මිලියන 19.1ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇත.

ජාතික ඇගයීම් වැඩසටහන සඳහා උපායමාර්ගික මාර්ගෝපදේශනය සහ අධීක්ෂණය සැපයීමේ අරමුණින්, ජාතික ඇගයීම් මෙහෙයුම් කමිටුව (NESC) 2025 ජූලි 29 සහ 2025 දෙසැම්බර් 09 යන දිනවලදී රැස්වීම් දෙකක් පවත්වන ලදී.

තවද, 2025 මාර්තු 11 සහ 12 යන දෙදින තුළ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී (Sri Lanka Foundation Institute) නේවාසික නොවන පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. එම පුහුණු වැඩසටහන සඳහා රේඛීය අමාත්‍යාංශ 11ක, පළාත් සභා 3ක සහ මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළුව නිලධාරීන් 44 දෙනෙකු සහභාගී වූහ.

| වගුව අංක 2.5.1: ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව (NEPIF) ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය (01.01.2025 – 31.12.2025 දින දක්වා) | |
|---|---|
| කාර්ය වර්ගීකරණය | ක්‍රියාකාරකම් / අවස්ථා / සහභාගිවූවන් ගණන |
| ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු (National Evaluation Steering Committee) රැස්වීම් | සහභාගිවන්නන් 43 ක (රැස්වීම් 2) |
| 2025 වර්ෂය තුළ අදාළ අමාත්‍යාංශවලින් ක්‍රියාත්මක කිරීමට NESC විසින් අනුමත කරන ලද ඇගයීම් යෝජනා සංඛ්‍යාව | 3 |
| 2025 වර්ෂය තුළ පළාත් සභා මට්ටමේ ක්‍රියාත්මක කිරීමට NESC විසින් අනුමත කරන ලද ඇගයීම් යෝජනා සංඛ්‍යාව | 6 |
| ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව (NEPIF) සම්බන්ධ Trainer of Trainers (TOT) වැඩසටහන් සංවිධානය කළ සංඛ්‍යාව | 2 |
| NEPIF පිළිබඳ TOT වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | 125 |
| පිළිබඳව පැවැත්වූ සාමාන්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 1 |
| NEPIF පිළිබඳව පැවැත්වූ සාමාන්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | 44 |
| 2024 ඇගයීම් ක්‍රියාත්මක කළ දක්ෂිණ පෝෂණ වැඩසටහන - දකුණු පළාත් සභාව | 01 |

| වගුව අංක 2.5.2: 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති ඇගයීම් ප්‍රගතිය (01.01.2025 – 31.12.2025) | | | |
|---|---|---|---|
| අංකය | ඇගයීමේ නම | ක්‍රියාත්මක කළ ඒකකය | වර්තමාන තත්ත්වය |
| 01 | විසල් කුරුණෑගල ජල සම්පාදන හා මළාපවාහන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | ආසියානු සංවර්ධන බැංකු (ADB) මූල්‍ය සහාය සමඟ අවසන් ඇගයීම් වාර්තාව නිම කරන ලදී |
| 02 | බදුල්ල - චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීම | ප්‍රවාහන, මහමාර්ග,වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - අධිවේගී මාර්ග අංශය | ADB මූල්‍ය සහාය සමඟ අවසන් ඇගයීම් වාර්තාව නිම කරන ලදී |
| 03 | වන ගහනය වැඩිකිරීම සඳහා ප්‍රජා සහභාගීත්ව වැඩසටහන | පරිසර අමාත්‍යාංශය | ADB මූල්‍ය සහාය සමඟ අවසන් ඇගයීම් වාර්තාව නිම කරන ලදී |
| 04 | වනජීවී රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය | පරිසර අමාත්‍යාංශය (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) | ක්‍රියාත්මක වෙමින් පවතී |

| | | | |
|---|---|---|---|
| 05 | පාසැල් ළමා ආරක්ෂක කමිටු වැඩසටහන | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 06 | කෘෂි නිෂ්පාදන ගබඩා කිරීම සඳහා උෂ්ණත්වය පාලනය කලහැකි මෙ.ටො. 5000 ක ධාරිතාවෙන් යුත් ගබඩාවක් දඹුල්ල ප්‍රදේශයේ ඉදිකිරීම | වෙළඳ, වාණිජ්‍ය, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 07 | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය (මාතර) ඉදිකිරීම | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 08 | වෙල්ලමන්කර නව ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | මත්ස්‍ය, ජල හා සාගර සම්පත් අමාත්‍යාංශය | අවසන් වාර්තාව සකස් කර ඇත |
| 09 | සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබලගැන්වීම් අමාත්‍යාංශය | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 10 | කර්මාන්තපුර සංවර්ධනය කිරීමේ වැඩසටහන කාර්මික හා ව්‍යවසාය | සංවර්ධන අමාත්‍යාංශය | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 11 | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ණය ලබා දීමේ වැඩසටහන | මූල්‍ය, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2026 දෙවන කාර්තුවෙන් පසු ආරම්භ විය යුතුයි |
| 12 | උතුරුමැද පළාතේ පවතින වැව් තුල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය | උතුරුමධ්‍යම පළාත් සභාව | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 13 | “අත්කම් පියස” සුදුමැටි නිශ්පාදන, පර්යේෂණ හා ගෘහ භාණ්ඩ අලෙවි ප්‍රදර්ශණාගාරය ඉදිකිරීම | වයඹ පළාත් සභාව | අවසන් වාර්තාව සකස් කර ඇත |
| 14 | ජීවනෝපාය සහායක් වශයෙන් කුකුල් පාලනයට අවශ්‍ය යෙදවුම් ලබාදීම | උතුරු පළාත් සභාව | ක්‍රියාත්මක වෙමින් |

## 2.6 ප්‍රතිඵල පාදක කළමනාකරණය: ආයතනික ප්‍රතිඵල රාමු සහ කාර්ය සාධන ලකුණු පත්‍ර

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ, ආයතනික ප්‍රතිඵල රාමු (Organizational Results Frameworks - ORFs) සහ කාර්ය සාධන ලකුණු පත්‍ර (Performance Scorecards) සකස් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතන වෙත තාක්ෂණික සහාය ලබාදීම මඟින් දෙපාර්තමේන්තුව ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණ භාවිතයන් තවදුරටත් ශක්තිමත් කළේය. මෙම වැඩසටහන මඟින් ජාතික සංවර්ධන ප්‍රමුඛතා, ක්ෂේත්‍රගත අරමුණු සහ ව්‍යාපෘති මට්ටමේ ප්‍රතිඵල අතර අනුකූලතාව වර්ධනය

කිරීමට දායක වූ අතර, කාර්ය සාධන නිරීක්ෂණය සහ වාර්තාකරණයේ ගුණාත්මකභාවය, ඒකාකාරීභාවය සහ විශ්වසනීයත්වය ද ඉහළ නැංවීමට හේතු විය.

2025 ඔක්තෝබර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 25/1802/804/215 අනුව, රේඛීය අමාත්‍යාංශ 22ක් සඳහා සකස් කරන ලද ආයතනික ප්‍රතිඵල රාමු සහ කාර්ය සාධන ලකුණු පත්‍ර අනුමත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලියට දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

මෙමගින් දත්ත මත පදනම් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය වියදම්වල ඵලදායීතාව ඉහළ නැංවීම, ආයතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම, රාජ්‍ය අංශය තුළ කාර්ය සාධන මත පදනම් වූ නිරීක්ෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහ රේඛීය අමාත්‍යාංශවල විෂය පථයට අනුකූලව පුරවැසියන් වෙත සේවා සැපයීමේ කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා දායක විය.

**වගුව අංක 2.6: අමාත්‍ය මණ්ඩල ප්‍රතිඵල රාමුව (Ministerial Results Frameworks – MRF) සකස් කිරීම (01.01.2025 – 31.12.2025)**

| අමාත්‍ය මණ්ඩල ප්‍රතිඵල රාමුව ( MRF) සකස් කිරීමේ තත්ත්වය | සංඛ්‍යාව |
|---|---|
| අමාත්‍ය මණ්ඩල අනුමත කරන ලද සහ අවසන් කරන ලද MRFs | 22 |
| **රැස්වීම් / සාකච්ඡා වර්ගීකරණය** | **සංඛ්‍යාව** |
| රේඛීය අමාත්‍යාංශ මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නිලධාරීන් සමඟ රැස්වීම් | 03 |
| DPMM හි MRF සකස් කිරීම පිළිබඳ සාකච්ඡා | 04 |
| MRF ආයතනික කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 01 |
| **එකතුව** | **08** |

## 2.7 ඒකාබද්ධ කාර්තුපාදක ප්‍රගති සමාලෝචන රැස්වීම් (Integrated Quarterly Progress Review Meetings – IQPRMs)

ව්‍යුහගත නිරීක්ෂණ ක්‍රමවේද, ප්‍රගති සමාලෝචන යාන්ත්‍රණ සහ ආයතන අතර සම්බන්ධීකරණය තුළින්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, වගවීම ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ආයෝජනවලින් උපරිම වටිනාකමක් (Value for Money) ලබා ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව දායක වේ.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින රේඛීය අමාත්‍යාංශ සහ ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සක්‍රීය සහභාගිත්වය ඇතිව ඒකාබද්ධ කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් (Integrated Quarterly Progress Review Meetings – IQPRMs) දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලදී.

මෙම රැස්වීම් මඟින් ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ පුළුල් සමාලෝචනයක් සිදු කිරීම, අනුමත සැලසුම්වලට සාපේක්ෂව කාර්ය සාධනය තක්සේරු කිරීම, ක්ෂේත්‍ර හරහා බලපාන සහ ක්ෂේත්‍ර-

විශේෂිත ගැටලු හඳුනා ගැනීම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා කාලසීමා සහිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ එකඟතාවකට පැමිණීම සඳහා අවස්ථාව සැලසුණි.

තවද, ව්‍යාපෘතිවල ප්‍රධාන පාර්ශ්වකරුවන් එකම වේදිකාවකට එක් කරමින්, කාර්යක්ෂම හා ඵලදායී තීරණ ගැනීමට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට පහසුකම් සලසන වැදගත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ලෙස ද මෙම ඒකාබද්ධ කාර්තු පාදක ප්‍රගති සමාලෝචන රැස්වීම් (IQPRMs) ක්‍රියාත්මක විය.

මෙම වැඩපිළිවෙළේ ප්‍රධාන ප්‍රතිදාන අතර ඒකාබද්ධ ප්‍රගති ඇගයීම් සකස් කිරීම, පිරිවැය ඉක්මවා යාම් සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් කල්තියා හඳුනා ගැනීම, සැලසුම්ගත ප්‍රතිදාන සහ අයවැය ප්‍රතිපාදන අතර අනුකූලතාව වැඩිදියුණු කිරීම සහ පැහැදිලි වගකීම් පැවරීම් සහිත ක්‍රියාකාරී සැලසුම් ලේඛනගත කිරීම ඇතුළත් විය.

මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, මූල්‍ය විනය ශක්තිමත් කිරීම සහ සාක්ෂි මත පදනම් වූ කළමනාකරණ තීරණයන් හරහා රාජ්‍ය සම්පත් වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා දායකත්වයක් සැපයීමට හැකි විය. ඒකාබද්ධ කාර්තු පාදක ප්‍රගති සමාලෝචන රැස්වීම් (IQPRMs) සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව, 2025 වර්ෂය තුළ සියලුම රේඛීය අමාත්‍යාංශ ආවරණය වන පරිදි එවැනි රැස්වීම් තුනක් (03) පවත්වන ලදී.

වගුව අංක 2.7: **ඒකාබද්ධ කාර්තුපාදක ප්‍රගති සමාලෝචන රැස්වීම් (IQPRMs) ප්‍රගතිය – 31.12.2025**

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය | **1** වන රැස්වීමේ දිනය | **2** වන රැස්වීමේ දිනය | එක් අමාත්‍යාංශය තුළ පැවති රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ප්‍රවාහන, මහමාර්ග,වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - අධිවේගී මාර්ග අංශය | 20/03/2025 | 1/8/2025 | 2 |
| 2 | ප්‍රවාහන, මහමාර්ග,වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - අධිවේගී මාර්ග අංශය | 11/04/2025 | 14/8/2025 | 2 |
| 3 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය | 10/4/2025 | 19/09/2025 | 2 |
| 4 | වතු සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය. | 7/4/2025 | 22/10/2025 | 2 |
| 5 | කෘෂිකර්ම, ගොවිජන, ඉඩම් හා ජලාශ අමාත්‍යාංශය – කෘෂිකර්ම හා ගොවිජන අංශය | 25/03/2025 | 24/10/2025 | 2 |
| | කෘෂිකර්ම, ගොවිජන, ඉඩම් හා ජලාශ අමාත්‍යාංශය – ඉඩම් හා නළ ජලාශ අංශය | 28/03/2025 | 24/12/2025 | 2 |
| 6 | පරිසර අමාත්‍යාංශය | 14/05/2025 | 11/11/2025 | 2 |
| 7 | ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය | 9/5/2025 | 16/12/2025 | 2 |

| | | | | |
|---|---|---|---|---|
| 8 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 30/05/2025 | 16/10/2025 | 2 |
| 9 | ආරක්ෂක අමාත්‍යාංශය – ආරක්ෂක අංශය | 15/05/2025 | 29/09/2025 | 2 |
| | ආරක්ෂක අමාත්‍යාංශය – අපදා කළමනාකරණ අංශය | 21/05/2025 | 30/09/2025 | 2 |
| 10 | මහජන ආරක්ෂා සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 27/06/2025 | 21/10/2025 | 2 |
| 11 | බලශක්ති අමාත්‍යාංශය | 22/04/2025 | 20/08/2025 | 2 |
| 12 | වෙළඳ, වාණිජ්‍ය, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය | _ | 3/10/2025 | 1 |
| 13 | කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 2/5/2025 | 8/09/2025 | 2 |
| 14 | කම්කරු අමාත්‍යාංශය | 13/06/2025 | 10/10/2025 | 2 |
| 15 | අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | 20/05/2025 | 07/10/2025 | 2 |
| 16 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | 26/06/2025 | _ | 1 |
| 17 | මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | _ | 26/05/2025 | 1 |
| 18 | ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | 19/05/2025 | 28/11/2025 | 2 |
| 19 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | 22/05/2025 | 28/08/2025 | 2 |
| 20 | බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 25/06/2025 | 24/12/2025 | 2 |
| 21 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 17/05/2025 | 17/10/2025 | 2 |
| 22 | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය | 21/05/2025 | 12/09/2025 | 2 |
| 23 | ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජාසවිබලගැන්වීම් අමාත්‍යාංශය | 24/06/2025 | 22/10/2025 | 2 |
| 24 | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 02/06/2025 | 18/09/2025 | 2 |
| 25 | යෞවන කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය | 13/06/2025 | 15/09/2025 | 2 |
| **එකතුව – පැවති රැස්වීම් සංඛ්‍යාව:** | | **25** | **26** | |
| | | **51** | | **51** |

## 2.8 අයවැය යෝජනා (Budget Proposals) ප්‍රගති සමාලෝචනය

2025.03.22 දින භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කරන ලද අයවැය ක්‍රියාත්මක කිරීමේ චක්‍රලේඛ අංක 01/2025 අනුව, මෙම දෙපාර්තමේන්තුවට එහි සාමාන්‍ය අධීක්ෂණ හා ඇගයීම් කාර්යභාරයන්ට සමගාමීව, අයවැය කථාවේ ප්‍රකාශයට පත් කරන ලද අයවැය යෝජනා 54ක ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම හා අධික්ෂණය සඳහා උපදෙස් ලබා දී තිබුණි. අයවැය යෝජනා, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ අපේක්ෂිත ප්‍රතිඵල අතර අනුකූලතාව තහවුරු කිරීමේ අරමුණින්, පැහැදිලිව නිර්වචනය කරන ලද වාර්තාකරණ අවශ්‍යතා සහ පසු විපරම් ක්‍රියාමාර්ග සහිත ව්‍යුහගත මාසික සමාලෝචන රැස්වීම් මඟින් අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

මෙම මාසික සමාලෝචනවලදී සැලසුම්ගත ප්‍රතිදාන (Outputs) සහ ප්‍රධාන සන්ධිස්ථාන (Milestones) සම්බන්ධයෙන් අත්කරගෙන තිබූ ප්‍රගතිය ඇගයීම, අනුමත ක්‍රියාත්මක කිරීමේ කාලරාමු හා කාලසටහන්වලින් සිදුවූ අපගමන විශ්ලේෂණය කිරීම, සහ අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට බලපාන අවදානම් සාධක හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම ක්‍රියාවලිය මඟින් ක්‍රියාත්මක කිරීමේ සීමාකාරී සාධක සහ බාධක මුල් අවධියේදීම හඳුනා ගැනීමට හැකි වූ අතර, අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ක්‍රියාත්මක කිරීමේ ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් කාලෝචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග (Corrective Actions) ගැනීමට ද පහසුකම් සැලසුණි.

මෙම නිරීක්ෂණ ක්‍රමවේදය ප්‍රතිඵලයක් ලෙස, අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ නවීන කාර්යසාධන දර්ශනයක් පවත්වා ගැනීමට, ප්‍රතිඵල සඳහා වගකීම්භාරය ශක්තිමත් කිරීමට, සහ කළමනාකරණ හා ප්‍රතිපත්ති මට්ටමේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය ආදානය සැපයීමට දෙපාර්තමේන්තුවට හැකි විය. සමස්තයක් ලෙස, අයවැය යෝජනා නිරීක්ෂණය කිරීම අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමටත්, ප්‍රතිපත්තිමය බැඳීම් මැනිය හැකි සංවර්ධන ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමටත් සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

## 2.9 අධීක්ෂණ හා ඇගයීම් (M&E) කණ්ඩායම පිහිටුවීම

රාජ්‍ය අංශය තුළ අධීක්ෂණ හා ඇගයීම් ක්‍රියාපටිපාටි ශක්තිමත් කිරීම, ආයතනික හැකියාව වැඩිදියුණු කිරීම සහ සම්මතයන් රැකීම සඳහා, අදාළ අංශවල අධීක්ෂණ හා ඇගයීම් කණ්ඩායමක් ජාතික සම්මුතිමය වේදිකාවක් ලෙස පිහිටුවන ලදී. මෙම ක්‍රියාකාරී කණ්ඩායමට සියලුම රේඛීය අමාත්‍යාංශවල සැලසුම් අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ පළාත් සභා නවයේම නියෝජනය වන පරිදි සැලසුම් භාර නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් ඇතුළත් වන අතර, ඒ මඟින් ජාතික හා උපජාතික මට්ටම් දෙකෙහිම පුළුල් නියෝජනයක් සහතික කර ඇත.

ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවධියේදී මතුවන සැලසුම්කරණ හා අධීක්ෂණ සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම, විශේෂයෙන් සැලසුම් හා අධීක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන් (Focal Points) මුහුණදෙන ගැටලු සඳහා ප්‍රායෝගික විසඳුම් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ක්‍රියාකාරී කණ්ඩායම ව්‍යුහගත සංවාද වේදිකාවක් ලෙස ක්‍රියා කරයි.

මෙම ක්‍රියාකාරී කණ්ඩායමේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස, ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගේ තාක්ෂණික සහාය ඇතිව වර්ෂය තුළ නිලධාරීන් 63 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළු වට දෙකක් පවත්වන ලදී.

මෙම වැඩමුළු මඟින් ප්‍රතිඵල මත පදනම් වූ නිරීක්ෂණය, ඇගයීම් ක්‍රමවේද සහ තීරණ ගැනීම සඳහා ඇගයීම් ප්‍රතිඵල භාවිත කිරීම සම්බන්ධ තාක්ෂණික දැනුම සහ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මීට අමතරව, අමාත්‍යාංශ සහ පළාත් සභා අතර අත්දැකීම් හුවමාරු කර

ගැනීම, පොදු අභියෝග පිළිබඳ සාකච්ඡා කිරීම සහ යහපත් භාවිතයන් ප්‍රචාරණය කිරීම සඳහා ද මෙම වැඩමුළු වැදගත් වේදිකාවක් ලෙස ක්‍රියා කළේය.

## 2.10 සංවර්ධන ව්‍යාපෘති සහ වාර්ෂික වැඩසටහන් කාර්යසාධන ප්‍රකාශ කිරීම

කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ, අධීක්ෂණය හා ඇගයීම් පද්ධති මඟින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු අදාළ පාර්ශ්වකරුවන් වෙත කාලෝචිතව වාර්තා කිරීමට හැකි වන අතර, ක්‍රියාත්මක කිරීමේ බාධක, අවදානම් සහ මතුවන ගැටලු සඳහා විසඳුම් ලබාදීමේදී සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා ද සහාය වේ.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, දේශීය සහ විදේශීය මූල්‍ය ප්‍රභවයන් යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සහ වැඩසටහන් කාර්යක්ෂමව හා නියමිත කාලසීමාවන් තුළ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මූලෝපායික අධීක්ෂණය, තාක්ෂණික මාර්ගෝපදේශනය, සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම සිදු කරනු ලබයි.

ඒ අනුව, සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්වල කාර්ය සාධනය පිළිබඳ කාර්තුමය ප්‍රගති වාර්තා සහ ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

ව්‍යාපෘති ප්‍රගතිය පිළිබඳ අදාළ තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයින්, සංවර්ධන හවුල්කරුවන් සහ මූල්‍ය ආධාර සපයන ආයතන වෙත බෙදා හරින ලද අතර, පසුව ඒවා මුදල්, සැලසුම් හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි (www.treasury.gov.lk )ප්‍රකාශයට පත් කරන ලදී. එමඟින් මහජනතාවට, සිවිල් සමාජ සංවිධානවලට සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට රාජ්‍ය වියදම්, සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අවස්ථාව සැලසී ඇත.

# පරිච්ඡේද 03 - සමස්ත මූල්‍ය ප්‍රගතිය

## 3.1 අයවැය තොරතුරු

2025 වර්ෂය සඳහා අනුමත ඇස්තමේන්තුව සහ වාර්ෂික වියදම වගු අංක 3.1 සහ ප්‍රස්ථාර අංක 01හි දැක්වේ. අයවැය සම්බන්ධ විස්තරාත්මක වාර්තාව පහත දක්වා ඇත.

| වගු අංක 3.1 : අයවැය තොරතුරු 31.12.2025<br>ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් 2025 - රු. මිලියන | | |
|---|---|---|
| **කාණ්ඩය** | **ඇස්තමේන්තු වියදම** | **සත්‍ය වියදම** |
| ප්‍රාග්ධන වියදම | 103 | 99.60 |
| පුනරාවර්තන වියදම | 37 | 25.83 |
| **මුළු වියදම** | **140** | **125.43** |

**ප්‍රස්ථාර අංක 3.1: අයවැය තොරතුරු 31.12.2025 දක්වා**



## 3.2 2025 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තත්‍ය 2025 රු. | 2024 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 99,633,000 | 79,210,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 133,965 | 747,676 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 7,799,714 | 6,162,797 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **107,566,679** | 86,120,473 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **107,566,679** | 86,120,473 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 12,273,765 | 744,622 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 95,292,914 | 85,375,851 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 77,950,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 76,869,021 | 61,935,795 | ඒසීඒ-2(ii) |
| 24,760,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 22,477,142 | 19,353,061 | ඒසීඒ-2(ii) |
| 290,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 251,797 | 259,350 | ඒසීඒ-2(ii) |
